# කාර්ය පත්‍රිකාව

**1.** පන්තිය : 8 ශ්‍රේණිය    විෂය : විද්‍යාව    අදාල සතිය : 01 සතිය ඔක්තෝම්බර්

**2.** ඒකකය : 12 **ජීවීන්ගේ ජීවන චක්‍ර**

## 3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

I. විද්‍යාව පෙළ පොතේ 12 වන පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. කතුරුමුරුංගා/ඇත්තෝර වැනි ශාක පත්‍ර වල වෙසෙන කුඩා පණුවන් බෝතලයකට දමා ඇතුළට වාතාශ්‍රය යන සේ කට වසා එම පණුවාගේ විවිධ අවස්ථා නිරීක්ෂණය කර අදාල නිරීක්ෂණ සටහන් කර ගන්න.

iii. කුඩා පොකුණක් වැනි ජලජ පරිසර වල සිටින මැඩියාගේ බිත්තර , ඉස්ගෙඩි වැනි විවිධ අවස්ථා නිරීක්ෂණය කර සුවිශේෂී ලක්ෂණ හඳුනාගෙන වාර්තා කරන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://drive.google.com/file/d/17mK9IUSqX6yU-Rf5W7AD33ToZPHIPsXx/view
- **https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18375**
- **https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25694**
- **https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25696**

II. **Youtube:**

- https://www.youtube.com/watch?v=bbmmJjLbJCE
- https://www.youtube.com/watch?v=D7Q-SofTjI8

## 5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

I. සෑම ජීවියෙකුම ජීවන චක්‍රයකින් සම්පූර්ණ වන ජීවිත කාලයක් ඇති බව හදුනා ගනී.

II. රූපාන්තරණය යන පදය විස්තර කරයි.

III. රූපාන්තරණය සහිත ජීවන චක්‍ර ඇති ජීවීන් හා රූපාන්තරණය රහිත ජීවන චක්‍ර ඇති ජීවීන් සඳහා උදා. සපයයි.

IV. සම්පූර්ණ හා අසම්පූර්ණ රූපාන්තරණ සඳහා නිදසුන් සපයයි.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

පහත වගන්ති වල හිස්තැන් වලට ගැලපෙන වචන තෝරා යටින් ඉරක් අඳින්න.

1) ජීවියෙකු ................(උපතේ/මරණයේ) සිට තම ජීවිත කාලය තුළ පසු කරන විවිධ අවධි අනුපිළිවෙල එම ජීවියාගේ ජීවන ........... (ගෝලය/චක්‍රය) ලෙස හැඳින්වේ.
2) ජීවියෙකුගේ ජීවන චක්‍රෙය් විවිධ අවධි වල එකිනෙකට .............(සමාන/වෙනස්) බාහිර ලක්ෂණ සහිත අවස්ථා .............(තිබීම/නොතිබීම) රූපාන්තරණය ලෙස හැඳින්වේ.
3) ජීවන චක්‍රෙය් විවිධ අවධි වල (බාහිර/අභ්‍යන්තර) රූපාකාරයේ .............(කැපී පෙනෙන/කැපී නොපෙනෙන) වෙනස් කම් පෙන්වීම සම්පූර්ණ රූපාන්තරණයක් ලෙස දැක්වේ.
4) ජීවියා ගත කරන අවධි වල බාහිර රූපාකාරයේ කැපී පෙනෙන ...............(සමාන කමක්/වෙනසක්) නොමැති විට එවැනි රූපාන්තරණයක් ............(සම්පූර්ණ/අසම්පූර්ණ) රූපාන්තරණයක් ලෙස හැඳින්වේ.
5) ....................(සමනලයින්/මීයන්) වැනි සතුන් බිත්තර වලින් බිහි වේ.බිත්තරය තුළ ඇතුළත් ...................(පෝෂක/ජලය) සුහුඹුලන් රැකීමට තරම් ප්‍රමාණවත් ................(වේ/නොවේ).එබැවින් අතරමැදි වර්ධන අවස්ථා ඇති වේ.